ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය (SLWJA)
මාධ්‍යසේවක වෘත්තීය සමිති සම්මේලනය (FMETU)
ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍යවේදීන්ගේ සංසදය (SLMMF)
ශ්‍රී ලංකා දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ සන්ධානය (SLTJA)
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM)

| SLWJ | FMETU | FMM | SLTMA | SLMMF |
|---|---|---|---|---|
| 07773112649 | 077703946 | 0777312457 | 077749408 | 0777270032 |

2008/07/01

*මාධ්‍ය නිවේදනය.*

# ජනමාධ්‍යවේදී නාමල් පෙරේරා පැහැරගැනීමට උත්සාහ දැරීම සහ පහරදීම

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ මාධ්‍ය නිදහස පිළිබඳ අංශයේ වැඩ බලන ප්‍රධානී සහ ජනමාධ්‍යවේදී  නාමල් පෙරේරා පූනි 30 දින සවස 6.30ට පමණ පැහැරගෙන යාමට දරන ලද උත්සාහය සහ පහර දීම අප සංවිධාන බලවත් කම්පනයට පත් කරයි. පුවතපත් ආයතනයේ මාධය නිදහස සඳහා අංශය වෙනුවෙන් සක්‍රීය වැඩ කොටසක් කළ නාමල් පෙරේරා මෑතක දී ජනමාධ්‍ය උද්ඝෝෂණ ගණනාවක් සම්බන්ධීකරනය කළේ ය. ඊට අමතරව ආරක්ෂ තොරතුරු වාර්තාකරවකු ලෙස කටයුතු කළ ජනමාධ්‍යවේදි නාමල් පෙරේරා ආරක්ෂක තොරතුරු විශ්ලේෂකයකු ලෙස ද කටයුතු කරමින් සිටී.

සිය කාර්යලයේ සිට  ඔහුගේ මිතුරකු වූ බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයේ දේශපාලන අංශයේ ප්‍රධානී මහේන්ද්‍ර රත්නවීර සමඟ නිවෙස බලා යමින් සිටි අතර වාරයේ දී යතුරු පැදියක් තමන් ලුහුබැඳ ආ බවත්, ඒ සමඟ ම පැමිණි සුදු පැහැති වෑන් රථයක් ඔවුන් ගේ මෝටර් රථයේ ගමන් මඟ හරස්කරමින් නවත්වා ඉන් බැස ගත් හය දෙනෙකු  පමණ මෝටර් රථයට පහරදී ජනේල වීදුරු බිඳ තමන්ට  පහර දුන් බව නාමල් පෙරේරා අප සංවිධානයන්ට පැවැසී ය.  පහර දෙන අතර තුර නාමල් පෙරේරා එළියට ඇද ගැනීමට උත්සාහ දරා ඇත්තේ 'උඹ තමයි ගෙනියන්න ඕනෑ' කියමිනි.

මෙම පහරදීමෙන් මහේන්ද්‍ර රත්නවීර මහතා ද බරපතල තුවාල ලබු අතර මේ වන විට දෙදෙනා ම රෝහල් ගතකර තිබේ. මෙම සාහසික ප්‍රහාරය අප හෙළා දකින්නේ දිනෙන් දින ඉහළ යන ජනමාධ්‍ය මර්දනයේ තවත් එක් අවස්ථාවක් ලෙස ය. මෙය කිසිම ලෙසකින් හුදකලා සිදුවිමක් ලෙස අප සංවිධාන නො සලකයි.

එදින දහවල් වරුවේ පුවත්පත් ආයතනය අභියසට පැමිණි යුද හමුදා ඇඳුම් ඇඳගත් යතුරුපැදිකරුවන් දෙදෙනකු සැක සහිත ලෙස එම ස්ථානයෙන් හරවා ගිය බවට එහි

සනත් බාලසූරිය 077 363 0000 - උවිඳු කුරුකුලසූරිය 0777 289289
ධර්මසිරි ලංකාපේලි 077 364 1111 - එන්.එම් අමීන් - ආර්. භාරතී
ශ්‍රී ලංකා මාධ්‍ය මධ්‍යස්ථානය, අංක 1C 1/1, 28 වැනි පටුමඟ, මල් පාර, කොළඹ 07.

ආරක්ෂ අංශ නිලධාරීන් සටහන් කොට තිබේ. මෙයට පෙර මැයි 27වන දින පුවත්පත් ආයතනට පැමිණි යුද හමුදා නිල ඇඳුමින් සැරසුණු පිරිසක් එහි සේවයේ නියුතු වූවන් ගේ තොරතුරු විමසා සිටි නමුත් යුද හමුදා ප්‍රකාශක පවසා සිටියේ එවැනි කණ්ඩායමක් යුද හමුදාවෙන් එහි නොයැවූ බව යි. ජනමාධ්‍යවේදී කීත් නොයාර් පැහර ගැනීමෙන් පසු නාමල් පෙරේරා ගේ නිවස අසලට සැක කටයුතු යතුරු පැදිකරුවන් ගැවසුන බව ද වාර්තා වී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ඔහු කිරුලපන පොලීසියට පැමිණිල්ලක් ද කර තිබේ.

එමෙන්ම පසුගිය 23වන දින රජයේ ප්‍රචාරක මාධ්‍යක් වන දිනමිණ පුවත්පත සහමුලින්ම ගොතන ලද පුවතක් පළ කරමින් කියා සිටියේ පුවත්පත් ආයතනය කොටි සංවිධානයේ සාමාජිකයින් එතෙර යැවීමට කටයතු කර ඇති බව යි. මෙම පුවත ගොතා පළ කරන ලද්දේ මෙම ප්‍රහාරයට පසුබිම සැකසීමට බව අප සංවිධාන බලවත් ලෙස සැක කරයි.

මෙම පැහැරගෙන යැමේ උත්සාහය දූරුනේ කොළඹ ජනාකීර්ණ පෙදෙසක් වන කිරුළපන සහ නාරාහේනපිට අතර බේස්ලයින් මාවතේ දී අධික රථවාහන ගමනාගමනයක් ඇති සවස් යාමයේ දී ය. මෙම පහරදීම සිදුවූ ස්ථානය ඉදිරිපසින් මෙන්ම පසුපසින් ද පෙනෙන නොපෙනෙන මානයේ ආරක්ෂ අංශ මුර කපොලු දෙකක් තිබේ. මෙවැනි තත්ත්වයක් යටතේ ව්‍යාජ අංක තහඩු සහිත ව පොලු මුගුරු ගෙන ගමන් කිරිමත් ප්‍රහාරයෙන් පසුව නිරුපද්‍රිතව පලා යාමට හැකි විමත් ඉතාමත් සැක කටයුතු බව අප සංවිධාන ප්‍රකාශ කර සිටී.

මෙම ප්‍රහාරය පිළිබඳ සැබෑ තතු සොයා වාර්තා කිරීම ආණ්ඩුව පත්කළ ජනමාධ්‍ය ගැටළුවලට පිළිතුරු සෙවීමේ කමිටුව මුහුණ දෙන අභියෝගයක් බව අපි කියා සිටිමු.

මෙම ජනමාධ්‍ය විරෝධි සාහසිකත්වය නතර කිරීමට පෙරට එන ලෙස මෙරට සියළුම ප්‍රජාතන්ත්‍රවාදී බලවේග සහ පුරවැසියන්ගෙන් අප සංවිධාන ඉල්ලා සිටී.

සනත් බාලසූරිය 077 363 0000 - උවිඳු කුරුකුලසූරිය 0777 289289
ධර්මසිරි ලංකාපේලි 077 364 1111 - එන්.එම් අමින් - ආර්. භාරතී
ශ්‍රී ලංකා මාධ්‍ය මධ්‍යස්ථානය, අංක 1C 1/1, 28 වැනි පටුමඟ, මල් පාර, කොළඹ 07.